පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය

நிருவாக மேன்முறையீடுகள் நியாய சபை

Administrative Appeals Tribunal

කාර්ය සාධන වාර්තාව

2024

D:\YEAR END\REPOTS\KAARYA SAADANA WAARTHA\2024 KAARYA SAADANA WAARTHAWA\KAARYA SAADANA WAARTHAWA 2024.DOCX

පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය

2024 කාර්ය සාධන වාර්තාව

පටුන			පිටු අංකය
	1.1	හැඳින්වීම	1
	1.2	ආයතනයේ දැක්ම, මෙහෙවර අරමුණු	1
	1.3	ප්‍රධාන කාර්යයන්	1
	1.4	සංවිධාන සටහන්	2
02.		ප්‍රගතිය හා ඉදිරි දැක්ම	3
03.		2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වන මූල්‍ය කාර්ය සාධනය	4
	3.2	මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය	6
	3.3	මුදල් ප්‍රවහ පිළිබඳ ප්‍රකාශය	7
	3.5	ආදායම් එකතු කිරිමේ කාර්ය සාධනය	8
	3.6	වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය	8
	3.8	මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය	8
	3.9	විගණකාධිපතිවරයා විසින් නිකුත් කරන ලද ආවරණ ලිපිය	10
		විගණකාධිපතිගේ වාර්ෂික විගණන වාර්තාව	11
04.		කාර්යසාධන දර්ශක	15
05.		තිරසාර සංවර්ධන අරමුණු සපුරාගැනීම් කාර්ය සාධනය	15
06.		මානව සම්පත් පැතිකඩ	15
	6.1	සේවක සංඛ්‍යා කළමනාකරණය	15
	6.3	මානව සම්පත් සංවර්ධන	15
07.		අනුකූලතා වාර්තාව	16

2024 වර්ෂය සඳහා වාර්ෂික කාර්ය සාධන වාර්තාව

ආයතනයේ නම: පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය

වැය ශීර්ෂ අංක 09

1.1 <u>හැඳින්වීම</u>

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 17 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් සංශෝධිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 59 (1) ඡේදය යටතේ වූ 2002 අංක 4 දරන පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය පනතේ විධිවිධානයන් ප්‍රකාර පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය පිහිටුවා ඇත.

1.2 <u>ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු</u>

1.2.1. <u>දැක්ම</u>

සේවා දායකයන්ගේ වෘත්තීයමය ගැටලුවලට පරිපාලනමය රෙගුලාසිවලට අනුව සාධාරණ ව විසඳුම් ලබා දීම.

1.2.2. <u>මෙහෙවර</u>

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ix වැනි පරිච්ඡේදයෙන් පවරා ඇති බලතල ක්‍රියාත්මක කරමින් රාජ්‍ය නිලධාරියෙකු හෝ පොලිස් නිලධාරියෙකු සම්බන්ධව රාජ්‍ය සේවා කොමිෂන් සභාව හෝ ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් ගනු ලබන තීරණයක් හෝ නියමයක් පිළිබඳව ගුණාත්මක සහ ස්වාධීන සමාලෝචනයක් සිදුකර පරිපාලනමය සාධාරණත්වය ඉටු කර දීම.

1.3 <u>ප්‍රධාන කාර්යයන්</u>

1.3.1 රාජ්‍ය නිලධාරීන් සහ පොලිස් නිලධාරීන් සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව හෝ ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් දෙනු ලබන තීරණයන්ට සහ නියමයන්ට එරෙහිව ගොනු කරනු ලබන අභියාචන විමර්ශනය කර විනිශ්චයන් ලබාදීම

1.3.2. අභියාචන භාර ගැනීම
2002 අංක 4 දරන පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය පනතේ 4 (1) සහ 4(2) අනුව ඉදිරිපත් කළ යුතු ය.

1.3.3 අභියාචනයක් ලද පසු ගන්නා පියවර
එකී පනතේ 5(1) සහ 5(2) ක්‍රියාපරිපාටිය මූලික පියවර ගෙන 6(අ), (ආ), (ඇ), (ඈ) අනුව ක්‍රියා කිරීම

1.3.4 අදාල පනතේ 7 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව අභියාචනය ලැබී මාස 2 ක් ඇතුළත අවසන් වශයෙන් සුදුස්සක් කළ යුතු ය.

1.3.5 අදාල පනතේ 8(1) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව නඩු විභාගය සිදු කරනු ලබන අතර 8(2) වගන්තියට අනුව එකී තීරණයක් අවසානාත්මක හා තීරණාත්මක වන අතර එය අධිකරණයක යම් නඩුවකදී හෝ නඩු කටයුත්තකදී ප්‍රශ්න කරනු නොලැබිය යුතු ය.

1.4 සංවිධාන සටහන



පනතේ 2 වගන්තිය යටතේ පැවරී ඇති බලතල අනුව අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් සභාපතිතුමා ඇතුළු තිදෙනෙකුගෙන් සමන්විත විනිශ්චය මණ්ඩලයක් පත් කරනු ලැබේ.

2024.12.31 දිනට සංයුතිය:

සභාපති	විශ්‍රාමික ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු කේ.ටී.චිත්‍රසිරි මහතා
සාමාජික	ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශ්‍රාමික ජේ.ජේ.රත්නසිරි මහතා
සාමාජික	විශ්‍රාමික මහාධිකරණ විනිසුරු එස්.නන්දසේකරන් මහත්මිය

ලේකම්	පී.වඩුගේ මහතා
සහකාර ලේකම්	එම්.රෆීක් ඉස්මායිල් මහතා

D:\YEAR END\REPOTS\KAARYA SAADANA WAARTHA\2024 KAARYA SAADANA WAARTHAWA\KAARYA SAADANA WAARTHAWA 2024.DOCX

02. ප්‍රගතිය හා ඉදිරි දැක්ම

I. අභියාචන සම්බන්ධ ප්‍රගතිය - 2024.12.31 දිනට

2024.01.01 දිනට ඉදිරියට ගෙන ආ අභියාචන සංඛ්‍යාව		1007
නැවත කැඳවූ අභියාචන සංඛ්‍යාව	20	
2024 වර්ෂය තුළ ලද අභියාචන සංඛයාව	500	520
කාලසීමාව තුළ විභාග කිරීමට තිබූ මුළු අභියාචන සංඛ්‍යාව		1,527
කාලසීමාව තුළ ඉල්ලීමට ඉඩදුන් අභියාචන සංඛ්‍යාව	36	
කාලසීමාව තුළ ඉල්ලා අස්කරගත් අභියාචන සංඛ්‍යාව	67	
නිෂ්ප්‍රභ කළ අභියාචන සංඛ්‍යාව	211	
අභියාචකගේ / රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ/ ජාතික පොලිස් කොමිෂන් සභාවේ ඉල්ලීම මත බහා තබන ලද අභියාචන සංඛ්‍යාව	141	
ඒ අනුව මෙම කාලසීමාව තුළ අවසන් කළ අභියාචන සංඛ්‍යාව		455
2024.12.31 දිනට අවසන් නොවූ 2025 වර්ෂයට ගෙන ගිය අභියාචන සංඛ්‍යාව		1,072

II. ඉදිරි දැක්ම

1. රාජ්‍ය සේවා කොමිෂන් සභාව හා පොලිස් කොමිෂන් සභාව හරහා ඉදිරිපත් කෙරෙන අභියාචන පිළිබඳව මේ වන විටත් ආරම්භකොට පවත්වාගෙන යනු ලබන කටයුතු නොපිරිහෙළා, නොවලහා යථාවත් කිරීම හා තවදුරටත් ඉදිරිපත් කෙරෙන අභියාචන සම්බන්ධයෙන් තත්ත්වාකාරයෙන් කටයුතු කිරීම.
2. 21 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය අනුව බලාත්මක කරන ලද විගණන සේවා කොමිෂන් සභාව මඟින් දෙනු ලබන තීණයන්ට අදාල අභියාචන පිළිබඳ කටයුතු ද මෙම අධිකාරයට පැවරී ඇත.

3. නව සභාපතිතුමා පත්වීමෙන් පසු අවසන් කාර්තුවේ දී අභියාචන 279 ක් විසඳා අවසන් කළ අතර ඉදිරි වර්ෂය තුළදී ඉදිරියට ගෙනයන ලද අභියාචන වලින් අඩක් පමණ අවසන් කර ගැනීමට හැකි වෙතැයි අපේක්ෂා කරමු.

D:\YEAR END\REPOTS\KAARYA SAADANA WAARTHA\2024 KAARYA SAADANA WAARTHAWA\KAARYA SAADANA WAARTHAWA 2024.DOCX

03 පරිච්ඡේදය - 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්ය සාධනය

3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

ඒසීඒ-එෆ්

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය

සංශෝධිත අයවැය ප්‍රතිපාදන 2024		සටහන	තතය 2024	- 2023	
රු.			රු.	රු.	
-	**ආදායම් ලැබීම්**		-	-	
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	2	-	-	**ඒසීඒ-1**
-	ජාත්‍යන්තර වෙළඳාම මත බදු	3	-	-	
-	බදු නොවන ආදායම් හා වෙනත්	4	-	-	
-	**මුළු ආදායම් ලැබීම් (අ)**		-	-	
-	**ආදායම් නොවන ලැබීම්**		**-**	-	
-	භාණ්ඩාගාර අග්‍රිම		35,800,000	31,505,000	**ඒසීඒ-3**
-	තැන්පතු		-	-	**ඒසීඒ-4**
-	අත්තිකාරම් ගිණුම්		761,900	663,300	**ඒසීඒ-5**
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම්		-	-	
-	**මුළු ආදායම් නොවන ලැබීම් (ආ)**		**36,561,900**	32,168,300	
-	**මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)**		**36,561,900**	32,168,300	
	භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඈ)		55,527	985,422	
	ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඈ)		36,506,373	31,182,878	
	අඩු කළා : වියදම්				
24,060,000	වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	5	20,710,540	16,975,326	
16,140,000	අනෙකුත් භාණ්ඩ හා සේවා	6	14,993,332	13,975,395	**ඒසීඒ-2(ii)**
-	සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	7	-	-	
-	පොළී ගෙවීම්	8	-	-	
-	වෙනත් පුනරාවර්තන වියදම්	9	-	-	
40,200,000	**මුළු පුනරාවර්තන වියදම් (ඊ)**		**35,703,872**	30,950,721	
	මූලධන වියදම්				
-	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම්	10	-	-	

7,700,000	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	**11**	975,945	292,550	
-	ප්‍රාග්ධන මාරුකිරීම්	**12**	-	-	**ඒසීඒ-2(ii)**
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම	**13**	-	-	
100,000	හැකියා වර්ධනය	**14**	13,000	-	
-	වෙනත් මූලධන වියදම්	**15**	-	-	
7,800,000	**මුළු මූලධන වියදම් (උ)**		**988,945**	292,550	
	තැන්පතු ගෙවීම්		-	-	**ඒසීඒ-4**
	අත්තිකාරම් ගෙවීම්		490,000	500,000	**ඒසීඒ-5**
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම්		-	-	
	ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)		490,000	500,000	
	මුළු වියදම් එ = (ඊ+උ+ඌ)		37,182,817	31,743,271	
48,000,000	**දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)**		(676,444)	(560,393)	
	අග්‍රිම ගැලපුම් ප්‍රකාශනය අනුව ශේෂය		(676,444)	(560,393)	**ඒසීඒ-7**
	දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය				**ඒසීඒ-3**
			-	-	

3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

ඒසීඒ-පී

2024 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය

	සටහන	තත්‍ය 2024 රු.	2023 රු.
මූල්‍ය නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	ඒසීඒ-6	21,812,937	21,014,390
මූල්‍ය වත්කම්			
අත්තිකාරම් ගිණුම්	ඒසීඒ-5/5(ඒ)	1,109,100	1,381,000
මුදල් හා මුදල් සමාන දෑ	ඒසීඒ-3	-	-
මුළු වත්කම්		22,922,037	22,395,390
ශුද්ධ වත්කම් / ස්කන්ධය			
භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම්		1,109,100	1,381,000
දේපළ පිරියත හා උපකරණ සංචිතය		21,812,937	21,014,390
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	ඒසීඒ-5(බී)		
ජංගම වගකීම්			
තැන්පතු ගිණුම්	ඒසීඒ-4	-	
අග්‍රිම ශේෂය	ඒසීඒ-3	-	-
මුළු වගකීම්		22,922,037	22,395,390

පිටු අංක 01 සිට 18 දක්වා ඒසීඒ 1 සිට ඒසීඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ ඇමුණුම් පිටු අංක 19 සිට 20 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශනයන්හි සටහන් මගින් හෙළිදරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිත කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඒට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

25/2

ප්‍රධාන ගණන්දීමේ නිලධාරී
නම :
තනතුර :
දිනය :

කේ.ටී. චිත්‍රසිරි
විශ්‍රාමික ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු
සභාපති
පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය

ගණන්දීමේ නිලධාරී
නම : පී. වඩුගේ
තනතුර : ලේකම්
පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය
35, සිල්වා පටුමඟ,
රාජගිරිය.
02

ප්‍රධාන මූල්‍ය නිලධාරී/ප්‍රධාන ගණකාධිකාරී/
අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්)
නම :
ජේ.පී.එන්.සී. ජයකොඩි
ගණකාධිකාරී
පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය

3.3 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

ඒසීඒ-සී

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

	තත්‍ය	
	2024	**2023**
	රු.	රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		-
මුළු බදු ලැබීම්	-	-
ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර	-	-
ලාභ	-	-
ආදායම් නොවන ලැබීම්	-	-
අග්‍රිම ලැබීම්	35,800,000	31,505,000
තැන්පතු ලැබීම්	-	-
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	**37,227,144**	**32,675,093**
අඩුකළා : මුදල් වැය කිරීම්		
සහනාධාර සහ මාරුකිරීම්	-	-
වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම්	-	-
අත්තිකාරම් ගෙවීම්	490,000	500,000
තැන්පතු ගෙවීම්	-	-
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	**36,238,199**	**32,382,543**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)	**988,945**	**292,550**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
පොළී	-	-
ලාභාංශ	-	-
හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම	-	-
උපණය අයකර ගැනීම්	-	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)	**-**	**-**
අඩුකළා : මුදල් වැය කිරීම්		
භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම්	988,945	292,550
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	**988,945**	**292,550**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඈ)-(ඉ)	**(988,945)**	**(292,550)**
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ) + (ඊ)	**-**	**-**
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)	**-**	**-**
අඩුකළා : මුදල් වැය කිරීම්		
දේශීය ණය ආපසු ගෙවීම්	-	-
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	**-**	**-**
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)	**-**	**-**
මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ)+(ඒ)	**-**	**-**
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	**-**	**-**
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	**-**	**-**

3.4 <u>මූල්‍ය ප්‍රකාශ සටහන් - නැත</u>

3.5 <u>ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය</u>

රු. 000

ආදායම් කේතය	ආදායම් කේතයේ විස්තරය	ආදායම් ඇස්තමේන්තුව		එකතු කරන ලද ආදායම	
		මුල් ඇස්තමේන්තුව	අවසන් ඇස්තමේන්තුව	ප්‍රමාණය රු.	අවසාන ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස
20.3.9900	වෙනත් ආදායම්	ඇස්තමේන්තු කළ නොහැක.	-	665,244/-	-

3.6 <u>වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය</u>

ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කරනු ලැබු ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස
	මුල් ප්‍රතිපාදනය	අවසාන ප්‍රතිපාදනය		
පුනරාවර්තන ප්‍රාග්ධන	40,200,000 7,800,000	40,200,000 7,800,000	35,703,872 988,945	89% 13%

3.7 මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ / දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන - **නැත.**

3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

රු. 000

වත්කම් කේතය	කේත විස්තරය	2024.12.31 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය	2024.12.31 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය	ඉදිරියේ දී ගිණුම්කරණයට නියමිත	ප්‍රගතිය% ලෙස වාර්තා කිරීම
9151	ගොඩනැගිලි හා ව්‍යුහයන්	-	-	-	-
9152	යන්ත්‍රෝපකරණ	-	21,872,937	-	-
9153	ඉඩම්	-	-	-	-
9154	අස්පෘශ්‍ය වත්කම්	-	-	-	-
9155	ජීව විද්‍යාත්මක වත්කම්	-	-	-	-
9160	කෙරීගෙන යන වැඩ	-	-	-	-
9180	බදු දෙන ලද වත්කම්	-	-	-	-

3.9 විගණකාධිපතිගේ වාර්ෂික විගණන වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. PIC/B/AAT/2/24/08

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date 2025 මැයි 30 දින

04 JUN 2025

By Hand.

ප්‍රධාන ගණන්දීමේ නිලධාරී,

පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය

ශීර්ෂය 009 - පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරයේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව

යථෝක්ත වාර්තාව සහ මූල්‍ය ප්‍රකාශනයේ භාෂාත්‍රයෙන් වූ මුල් පිටපත් මේ සමඟ එවා ඇත.

ඒ.ජී.ඒ. හෙල්මිණි

ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති

විගණකාධිපති (වැ.බ.) වෙනුවට

පිටපත :- අධ්‍යක්ෂ ජනරාල්, රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව

අංක 306/72, පොල්දුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. PIC/B/AAT/2/24/08 මබේ අංකය / உமது இல. / Your No. දිනය / திகதி / Date 2025 මැයි 30 දින

04 JUN 2025

ප්‍රධාන ගණන්දීමේ නිලධාරී,
පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය

ශීර්ෂය 009 - පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරයේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

ශීර්ෂය 009 - පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරයේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශ වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ප්‍රධාන ගණන් දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව යථා කාලයේදී නිකුත් කරනු ලැබේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරයේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන වලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශන වලට අදාල සටහන් 1 හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

D:\YEAR END\REPOTS\KAARYA SAADANA WAARTHA\2024 KAARYA SAADANA WAARTHAWA\KAARYA SAADANA WAARTHAWA 2024.DOCX

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැක මුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම්කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 වියදම් කළමනාකරණය

මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව වියදම් ඇස්තමේන්තු පිළියෙල නොකිරීම හේතුවෙන් පුනරාවර්තන වැය විෂයයන් 10ක හා ප්‍රාග්ධන වැය විෂයයන් 02ක ප්‍රතිපාදනයන් සියයට 18 සිට සියයට 94ක් දක්වා පරාසයක සමාලෝචිත වර්ෂයේදී උපයෝජනය නොකර ඉතිරි වී පැවතුණි.

3.2 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

නීති, රීති හා රෙගුලාසිවලට යොමුව		අනුකූල නොවීම
(අ)	2020 අගෝස්තු 28 දිනැති අංක 2020/02 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 04 ඡේදය	අධිකාරය විසින් සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොතිබුණි.
(ආ)	2018 පෙබරවාරි 20 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2018 2(iv) ඡේදය	කිසිදු හේතුවක් නිසා හෝ වයස අවුරුදු 67 සම්පූර්ණ කළ කිසිවෙකු රාජ්‍ය සේවයේ අනුමත තනතුරකට පත් නොකල යුතු වුවත් අවුරුදු 67 ඉක්ම වූ විශ්‍රාමික නිලධාරීන් 02 ක් අධිකාරයේ අනුමත තනතුරු 02 ක සේවයේ නියුක්ත කර තිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්යයසාධනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේදී නියැදි පරීක්ෂාවට ලක් වූ තීන්දු ලබා දී අවසන් කරන ලද ජාතික පොලිස් කොමිසම සහ රාජ්‍ය සේවා කොමිසමට අදාලව ලැබී තිබුණු අභියාචනා පැමිණිලි 64 ක් සම්බන්ධයෙන් තීරණ ලබා දීමේදී පොලිස් කොමිසමට අදාල පැමිණිලි 15 ක් විසඳීමේ දී මාස 06 සිට මාස 37 ක් දක්වා ද රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ පැමිණිලි 49 ක් විසඳීමේ දී මාස 03 සිට මාස 102 ක් දක්වා ද කාල පරාසයක් ගත වී තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය ආරම්භයේදී පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය වෙත විසඳීම සඳහා පැමිණිලි 1007 ක් පැවති අතර වර්ෂය තුල තවත් පැමිණිලි 522 ක් ලැබී තිබුණි. ඒ අනුව විසඳීම සඳහා තිබූ පැමිණිලි සංඛ්‍යාව 1529 ක් විය. ඉන් වර්ෂය තුල පැමිණලි 455 ක් අවසන් කර තිබූ අතර එලෙස අවසන් කල ආකාරය අනුව පැමිණිලි 141 ක් බහා තැබීමෙන්ද පැමිණිලි 216 ක් නිශ්ප්‍රභා කිරීමෙන්ද, පැමිණිලි 67 ක් ඉල්ලා අස්කර ගැනීමෙන්ද පැමිණිලි 36ක් විසඳීමෙන්ද නිමකර තිබූ අතර ඉන් පැමිණිලි අවසන් කිරීමේ ප්‍රගතිය සියයට 30ක් විය. තවද පැමිණිලි විසදා තීරණ ලබා දීම මගින් නිමකිරීමේ ප්‍රගතිය සියයට 02 ක් විය.

(ඇ) 2024 දෙසැම්බර් 31 දිනට අධිකාරය වෙත ලද පැමිණිලි වලින් 1074 ක් අවසන් කර නොතිබූ අතර එම පැමිණිලි අධිකාරය වෙත ලැබී තිබුණු දිනයන් අනුව නොවිසඳී තිබූ කාල පමාව වර්ෂ 02 ට අඩු ජාතික පොලිස් කොමිසම සහ රාජ්‍ය සේවා කොමිසමට අදාලව පිළිවෙලින් 144 ක් හා 197 ක්ද වර්ෂ 02 සිට වර්ෂ 04 දක්වා පිළිවෙළින් 141ක් හා 254 ක්ද විය. වර්ෂය අවසානයේ නොවිසඳා ඇති රාජ්‍ය සේවා කොමිසමට අදාල පැමිණිලි

72 ක් හා ජාතික පොලිස් කොමිසමට අදාල පැමිණිලි 264 ක් අධිකාරය වෙත ලැබී වර්ෂ 04 කට වඩා වැඩි කාලයක් ගත වී තිබුණි. ඉහත කරුණු අනුව අගතියට පත් පාර්ශවයන් විසින් මෙම අභියාචනා/පැමිණිලි යොමුකරන බැවින් දීර්ඝ කාලයක් ගත නොවී කඩිනමින් සහන සැලසීමේ ක්‍රමවේදයක අවශ්‍යතාවය විගණනයේදී නිරීක්ෂණය විය.

4.2 කළමනාකරණ දූර්වලතා

අධිකාරය පිහිටුවා වසර 22 කට අධික කාලයක් ගත වී තිබුණද එක් එක් තනතුරු සඳහා බඳවා ගැනීමේ පරිපාටි සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් සකස් කරගෙන නොතිබුණි.

5. මානව සම්පත් කළමනාකරණය

5.1 අනුයුක්ත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය

අධිකාරය විසින් විගණනයට ඉදිරිපත් කළ තොරතුරු අනුව 2024 දෙසැම්බර් 31 දිනට අනුමත කාර්ය මණ්ඩලය 32 ක් වුවද ස්ථිර කාර්ය මණ්ඩලය 14 ක් හා කොන්ත්‍රාත් පදනම මත පත්කරන ලද කාර්යය මණ්ඩලය 08 වූ හෙයින් කාර්ය මණ්ඩලයේ තනතුරු 10 ක පුරප්පාඩු තවදුරටත් පැවතුණි. ලේකම්, සහකාර ලේකම් සහ ගණකාධිකාරී යන ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු තුනම 2017 වර්ෂයේ සිට කොන්ත්‍රාත් පදනම මත වාර්ෂිකව නැවත පත්කරගෙන තිබුණි.

ඒ.ජී.ඒ. හෙල්මිණි
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති (වැ.බ.) වෙනුවට

D:\YEAR END\REPOTS\KAARYA SAADANA WAARTHA\2024 KAARYA SAADANA WAARTHAWA\KAARYA SAADANA WAARTHAWA 2024.DOCX

04 පරිච්ඡේදය - කාර්ය සාධන දර්ශක

4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක -

කාර්ය සාධන දර්ශක පිළියෙල කර නොතිබුණි.

05 පරිච්ඡේදය - තිරසාර සංවර්ධන අරමුණු සපුරා ගැනීමේ කාර්ය සාධනය

අධිකරණමය කටයුතු කෙරෙන බැවින් තිරසාර සංවර්ධන අරමුණු ඇස්තමේන්තු කළ නොහැක.

5.1 හදුනාගන්නා ලද අදාල තිරසාර සංවර්ධන අරමුණු දක්වන්න. - අදාල නොවේ.

06 පරිච්ඡේදය - මානව සම්පත් පැතිකඩ

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	ඇබෑර්තු / (අතිරික්ත)
ජ්‍යෙෂ්ඨ	03	03	-
තෘතියික	-	-	-
ද්විතියක	21	12	09
ප්‍රාථමික	08	07	01
එකතුව	32	22	10

6.2 පවතින සීමිත කාර්ය මණ්ඩලයට පුරප්පාඩු ද ආවරණය වන පරිදි ප්‍රායෝගික වශයෙන් යෝග්‍ය වන ආකාරයට රාජකාරි පවරා ඇති බැවින් අධිකාර කාර්යාලයීය රාජකාරි කටයුතු කෙරෙහි බලපෑමක් සිදු නොවීම.

6.3 මානව සම්පත් සංවර්ධන

වැඩසටහනේ නම	**පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව**	**වැඩසටහනේ කාල සීමාව**	**සමස්ථ ආයෝජනය රු. '000**		**වැඩසටහනේ ස්වභාවය (දේශිය / විදේශිය)**	**නිමැවුම් / ලබාගත් දැනුම**
			දේශිය	විදේශිය		
කාර්යාල ක්‍රම	01	දින 03	13,000/-		දේශිය	
සිගාස් වැඩසටහන	03	දින 04	-		දේශිය	

D:\YEAR END\REPOTS\KAARYA SAADANA WAARTHA\2024 KAARYA SAADANA WAARTHAWA\KAARYA SAADANA WAARTHAWA 2024.DOCX

07 පරිච්ඡේදය - අනුකූලතා වාර්තාව

අංකය	අදාළ කර ගතයුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තිරණ ක්‍රියාමාර්ග
1	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ / ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ.**			
1.2	වාර්ෂික මූල්‍ය ප්‍රකාශය	අනුකූල වේ.		
1.2	රාජ්‍ය නිලධාරින්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූල වේ.		
2.	**පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ.445)**			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.2	පුද්ගල පඩිනඩි ලේඛන / පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල නොවේ	අභ්‍යන්තර විගණන තනතුරක් අනුමත කාර්ය මණ්ඩලය තුල නොවේ.	ඒ සඳහා ලිපිකරු නිලධාරියෙකු යොදවා ඇත.
2.5	සියළුම මාසික ගිණුම් සාරාංශ (සිගාස්) පිළියෙල කර නියමිත දිනට මහ භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූල වේ.		
2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.8	තොග ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (ජීඒ එන් 20) යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ.		

03	**මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම (මු.රෙ. 135)**			
3.1	මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරා දී තිබීම	අනුකූල වේ.		
3.2	මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම	අනුකූල වේ.		
3.3	සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දී තිබීම	අනුකූල වේ.		
3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරන රාජ්‍ය ගිණුම් චක්‍ර ලේඛය අනුව රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	අනුකූල වේ.		
4	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ.		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූල නොවේ	විශාල වශයෙන් මිලදී ගැනීම් සිදු නොවේ.	2024 ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නැත.
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල නොවේ.	අභ්‍යන්තර විගණකයෙකු නොමැති නිසා එවැනි සැලසුම් සකස් නොකිරීම	ඉදිරි වර්ෂය සඳහා සැලැස්මක් සකස් කිරීමට අදහස් කරමි.
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (එන්ඞීබී) නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූල වේ.		
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබිම	අනුකූල වේ.		
5	**විගණන විමසුම්**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට සියළුම විගණන විමසුම්වලට පිළිතුරු ලබා දී තිබීම	අනුකූල වේ.		
6.	**අභ්‍යන්තර විගණනය**	අදාල නොවේ.		
7.	**විගණන හා කළමනාකරණ කමිටු**	අදාල නොවේ.		
8	**වත්කම් කළමනාකරණය**			
8.1	අංක 01/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍ර ලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව වත්කම් මිලදී ගැනීම් හා අපහරණය කිරීම පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ.		

D:\YEAR END\REPOTS\KAARYA SAADANA WAARTHA\2024 KAARYA SAADANA WAARTHAWA\KAARYA SAADANA WAARTHAWA 2024.DOCX

8.2	ඉහත සදහන් චක්‍ර ලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍ර ලේඛයේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සදහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබද තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තා කර තිබීම	අනුකූල වේ.		
8.3	රාජ්‍ය මුදල් චක්‍ර ලේඛ අංක 05/2016 අනුව භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ.		
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වු අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍ර ලේඛයේ සදහන් කාලය තුළ සිදුකොට තිබීම	අනුකූල වේ.		
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම	අනුකූල වේ.		
9.	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සදහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	අනුකූල වේ.		
9.2	වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලකදි අපහරණය කර තිබීම	අනුකූල නොවේ.	ගර්හිත වාහන නොවීම	අවශ්‍ය වුවහොත් එසේ කිරීමට අදහස් කිරීම
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන් මු.රෙ. 103, 104, 109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම	අනුකූල වේ.		
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරන රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛයේ 3.1 ඡේදයේ සදහන් විධිවිධාන ප්‍රකාරව, වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම	අනුකූල වේ.		
9.6	කල්බදු කාල සීමාවෙන් අනතුරුව බදු වාහන ලොග් පොත්වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම	අනුකූල වේ.		
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසදුම් ප්‍රකාශ පිළියෙල කර සහතික කර ඒවා විගණනය සදහා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ.		
10.2	සමාලෝචිත වර්ෂයේ දි හෝ ඊට පෙර වර්ෂවල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම	අනුකූල නොවේ.	අක්‍රිය බැංකු ගිණුම් නොවීම	අක්‍රිය බැංකු ගිණුම් ඇති නොවීමට කටයුතු කිරීම

10.3	බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ.		
11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූල වේ.		
11.2	මු.රෙ. 94(1) ප්‍රකාරව සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එළැඹීම	අනුකූල වේ.		
12	**රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම**			
12.1	සීමාවන්ට අනුකූල වීම	අනුකූල වේ.		
12.2	හිඟ හිටි ණය ශේෂ පිළිබද කාල විශ්ලේෂණයක් සිදුකර තිබිම	අනුකූල නොවේ.	කල් ඉකුත් වූ ණය ශේෂ නොවීම	හිඟ ණය ශේෂ වුවහොත් එසේ කටයුතු කිරීම
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිගහිටි ණය ශේෂ නිරවුල් කර තිබිම	අනුකූල වේ.		
13	**පොදු තැන්පත් ගිණුම**			
13.1	කල් ඉකුත් වූ තැන්පත් සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කිරිම	අනුකූල නොවේ	පොදු තැන්පත් ගිණුමක් නොවීම	
13.2	පොදු තැන්පතු සදහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල නොවේ	පොදු තැන්පත් ගිණුමක් නොවීම	පොදු තැන්පත් ගිණුමක් සඳහා අවශ්‍යතාවක් ඇතිවූවහොත් ඒ සඳහා අනුමැතිය ලබා ගැනීමට කටයුතු කිරීම
14	**අග්‍රිම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම	අනුකූල වේ.		
14.2	මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල නොවේ.	තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කිරිම කරනු නොලැබේ.	එවැනි අවශ්‍යතාවක් වුවහොත් එපරිද කටයුතු කිරීම
14.3	මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම	අනුකූල නොවේ.	තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කිරිම කරනු නොලැබේ.	එවැනි අවශ්‍යතාවක් වුවහොත් එපරිදි කටයුතු කිරීම

14.4	අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමග මාසිකව සැසඳුම් කිරීම	අනුකූල වේ.		
15	**ආදායම් ගිණුම**	අනුකූල නොවේ.	ආදායම් ගිණුමක් නැත.	ආදයම් ඉපයීමේ ආයතනයක් නොවේ.
16.	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම	අනුකූල වේ.		
16.2	කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම	අනුකූල වේ.		
16.3	20.09.2017 දිනැති එම්එස්ඩී චක්‍ර ලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ.		
17	**මහජනයා වෙත තොරතුරු ලබා දීම**			
17.1	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත්කොට තොරතුරු ලබාදීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
17.2	ආයතන පිළිබද තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබද මහජනයාගේ ප්‍රශංසා / චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම	අනුකූල වේ.		
17.3	තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම	අනුකූල නොවේ.	පුහුණුවීම් ලබා දී නැත.	
18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම**			
18.1	අංක 5/2008 හා 05/2018(1) දරන රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍ර ලේඛ අනුව පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්ම කර තිබිම	අනකූල නොවේ.	අධිකරණමය ක්‍රියාදාමයක් සිදුවන ආයතනයක් බැවින් මෙවැන්නක් ක්‍රියාත්මක කිරීමේ අපහසුතාව	2025 වර්ෂය සඳහා පුරවැසි ප්‍රඥප්තිය සකස් කිරීමට කටයුතු යොදා ඇත
18.2	එම චක්‍ර ලේඛයේ 2.3 ඡේදය පරිදි පුරවැසි/ සේවාලාභි ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරිමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගැයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබිම	අනුකූල නොවේ.	අධිකරණමය ක්‍රියාදාමයක් සිදුවන ආයතනයක් බැවින් මෙවැන්නක් ක්‍රියාත්මක කිරීමේ අපහසුතාව	2025 වර්ෂය සඳහා පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම සඳහා ක්‍රමවේදයක් සකස් කරගෙන යනු ලබයි.

19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම**			
19.1	2018.01.24 දිනැති රා.පරි.චක්‍ර ලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම	අනුකූල නොවේ.	සමස්ත කාර්ය මණ්ඩලය 22 දෙනෙකු වන නිසා අධිකරණමය කාර්යය භාරයයට මුල්තැන දී කටයුතු කිරීම	2025 වර්ෂය සදහා මානව සම්පත් සංවර්ධන සැලැස්මක් සකස්කොට ඇත.
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සදහා වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නො අඩු පුහුණු අවස්ථාවක් ඉහත සදහනා මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම	අනුකූල නොවේ.	සමස්ත කාර්ය මණ්ඩලය 22 දෙනෙකු වන නිසා අධිකරණමය කාර්යය භාරයයට මුල්තැන දී කටයුතු කිරීම	2024 වර්ෂයේ නිලධාරින් 04 කු පුහුණුවීම් සදහා යොමු කර ඇත.
19.3	ඉහත සදහන් චක්‍ර ලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සදහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම	අනුකූල නොවි.	සමස්ත කාර්ය මණ්ඩලය 22 දෙනෙකු වන නිසා අධිකරණමය කාර්යය භාරයයට මුල්තැන දී කටයුතු කිරීම	සමස්ථ කාර්ය මණ්ඩල 22 ක් බැවින් ප්‍රායෝගිකව අත්හදා බැලීමට අදහස් කරමි.
19.4	ඉහත චක්‍ර ලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම	අනුකූල නොවේ.	සමස්ත කාර්ය මණ්ඩලය 22 දෙනෙකු වන නිසා අධිකරණමය කාර්යය භාරයයට මුල්තැන දී කටයුතු කිරීම	සමස්ථ කාර්ය මණ්ඩල 22 ක් බැවින් ඒ සදහා නිලධාරියෙකු යෙදවීමේ අපහසුතාවය
20	**විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම**			
20.1	ඉකුත් වර්ෂ සදහා විගණකාධිපති විසින් නිකුත් කල විගණන ඡේද මගින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම	අනුකූල වේ.		